ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපනපති උපාධි වැඩ සටහන

අවසාන පරීක්ෂණය - 2007

අධ්‍යාපනයේ මනෝ විද්‍යාත්මක පදනම - **ESP** 2311

කාලය පැය තුනයි.

---

දිනය - 2007.07.07 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

ඕනෑම ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.

01. ස්වභාව ධර්මය (**Nature**) යනු මිනිසා ඔහු සමග මෙලොවට රැගෙන එන සියළුම දෑ වේ. පෝෂණය (**Nurture**)යනු උත්පත්තියෙන් පසු ඔහු කෙරේ සිදුවන සියලුම බල පැවැත්වීම් ය. (ෆැන්සිස් ගැල්ටන් 1974)

   **i.** පූර්ව ප්‍රසව අවධියේ මානව සංවර්ධනය ආශ්‍රයෙන් මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න. (ලකුණු 10 යි.)

   **ii.** සංවර්ධන මනෝවිද්‍යාඥයින් ඉදිරිපත් කර ඇති මතවලට අනුව ළමයින්ගේ ප්‍රජානන සංවර්ධනය සම්බන්ධයෙන් ස්වභාව ධර්මයේ හා පෝෂණයේ (**Nature & Nurture**) භූමිකාව පැහැදිලි කරන්න. (ලකුණු 10 යි.)

   **iii.** පුද්ගලයින්ගේ පෞරුෂය හැඩ ගැස්වීමෙහිලා දෙමාපියන්ගේ බලපෑම විවේචනාත්මකව විග්‍රහ කරන්න. (ලකුණු 10 යි.)

02. "ආශ්‍රයෙන් ලබන ඉගෙනුම පිළිබඳව ශත වර්ෂ ගණනාවක සිට සාකච්ඡා කරනු ලැබුවද එම සංසිද්ධිය තත්වාරෝපණය පිළිබඳ තම සම්භාව්‍ය පර්යේෂණ තුළින් ග්‍රහණය කර ගැනීමේ කාර්ය පැවරුනේ අයිවන් පැවලෝව් වෙතය." (මයර්ස් 2004)

   **i.** 'ඉගෙනුම' නිර්වචනය කර ඉගෙනුම සිදුවන ආකාරය අවබෝධ කර ගැනීමේ පදනම වශයෙන් පැව්ලෝව්ගේ සම්භාව්‍ය තත්වාරෝපණ න්‍යාය වැදගත් වන්නේ මන්දැයි විස්තර කරන්න. (ලකුණු 10 යි.)

   **ii.** ස්කිනර්ගේ ප්‍රකාරක ආරෝපණ න්‍යාය පැව්ලෝව්ගේ න්‍යායයෙන් වෙනස් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 10 යි.)

   **iii.** ක්ෂෙත්‍ර ප්‍රජානන න්‍යායයනට අනුව ඉගෙනුම සිදුවන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10 යි.)

03. **i.** "මානව පෙළඹීමේ වඩාත් ධනාත්මක හා දියුණුව කෙරේ බලපාන අංශයන් මාස්ලෝ අවධාරණය කළේය." ඔබ මෙම ප්‍රකාශයට එකඟ වන්නේ ද? ඔබගේ පිළිතුර සනාථ කිරීමට හේතු තුනක් (03) දෙන්න. (ලකුණු 15 යි.)

ii. පන්ති කාමරය තුළ සිසුන්ගේ කාර්ය සාධනය තීරණය කිරීමෙහි ලා නිෂ්ටා (අරමුණු) පිහිටුවීම හා නිෂ්ටා කෙරේ කැපවීම එක සමානව වැදගත් වන අයුරු නිදසුන් සමග පරීක්ෂා කරන්න. (ලකුණු 10 යි.)

iii. ගුරුවරයෙකුට මෙම මූලධර්ම දෙකම පන්ති කාමරය තුළ සිසුන් පෙළඹවීම සඳහා භාවිත කළ හැක්කේ කෙසේදැයි විස්තර කරන්න. (ලකුණු 05 යි.)

04. i. සිග්මන්ඩ් ෆ්‍රොයිඩ්ගේ මනෝවිශ්ලේෂණ ප්‍රවේශයට අනුව පෞරුෂ සංවර්ධනය සාකච්ඡා කරන්න. (ලකුණු 10 යි.)

ii. පෞරුෂ සංවර්ධනය පිළිබඳ ෆ්‍රොයිඩ්ගේ විග්‍රහය කාල් රොජර්ස් ඒ පිළිබඳව ඉදිරිපත් කළ විග්‍රහය සමග පහත දැක්වෙන මාතෘකා යටතේ සංසන්දනය කරන්න.
(අ) අවධි
(ආ) කැපී පෙනෙන ලක්ෂණ (ලකුණු 10 යි.)

iii. ෆ්‍රොයිඩ්ගේ න්‍යාය අනුසාරයෙන් පෞරුෂ සංවර්ධනයේ දී පුද්ගලයෙකු මුහුණපාන ගැටළු තුනක් (03) සාකච්ඡා කරන්න. (ලකුණු 10 යි.)

05. i. වැඩිහිටියන්ගේ ඉගෙනුම් ශෛලීන් ළමයින්ගේ ඉගෙනුම් ශෛලීන්ගෙන් වෙනස්වන ආකාරය නිදසුන් සහිතව පැහැදිළි කරන්න. (ලකුණු 15 යි.)

ii. ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 21-35 ක් අතර වැඩිහිටියන්ගේ ඉගෙනුම සුසාධ්‍ය කිරීමෙහි ලා භාවිත කළ හැකි ක්‍රම තුනක් (03) පරීක්ෂා කරන්න. (ලකුණු 15 යි.)

06. i. "විශේෂ අවශ්‍යතා සහිත ළමයින්" යන පදය පැහැදිළි කරන්න. (ලකුණු 05 යි.)

ii. විශේෂ අවශ්‍යතා සහිත ළමයින් වර්ග දෙකක් තෝරාගෙන ඔවුන්ගේ ගති ලක්ෂණ සාකච්ඡා කරන්න. (ලකුණු 15 යි.)

iii. සාමාන්‍ය පන්තිකාමරය තුළ ඔවුනට සහය විය හැකි ආකාරය නිදසුන් දෙමින් පැහැදිළි කරන්න. (ලකුණු 10 යි.)

07. පහත දැක්වෙන මාතෘකා යටතේ කෙටි සටහන් ලියන්න.
අ. ළමා කාලයේ සංකල්ප සාධනය
ආ. මුල් ළමාවියේ සදාචාර සංවර්ධනය
ඇ. ජීවන සංවර්ධන ප්‍රවේශය

(ලකුණු 10 x 3 = 30 යි.)

- හිමිකම් ඇවිරිණි. -